


# අකීකරු දරුවන්

W.M. සෙනුකි ගිහංසා වීරවංශ

| | |
|---|---|
| කෘතියේ නම | : අකීකරු දරුවන් |
| කතෘගේ නම | : සෙනුකි ගිහංසා වීරවංශ |
| ශ්‍රේණිය | : 2E |
| කතෘ අයිතිය ඇතුළු විස්තර | : සියලුම හිමිකම් ඇවිරිණි |
| කතෘගේ වෙනත් කෘති | : අපූරු යාළුකම |
| කෘතිය පල කරන දිනය | : 08 - 02 - 2025 |
| ISBN | : 978624208359-9 |

# පිදුම

මාගේ ආදරණීය මහාමායා

මෑණියන්ට මගේ මේ පොත

ආදරයෙන් පුදමි.

## පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණි”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.




එකමත් එක කාලෙක පුංචි ගමක කුකුල් පවුලක් සහ තාරා පවුලක් ජීවත් වුණා.



උදේම කුකුල් තාත්තා පැටවුන්ට
කෑම සොයන්න කැලෑවට
ගියා.

කුකුල් පැටවු තාරා පැටවු එක්ක
සෙල්ලම් කරන්න
ගියා.



කුකුල් අම්මා ඇවිත් පැටවුන්ට වැඩි ඈතකට නොයා සෙල්ලම් කරන්න කිවුවා.






ඉතින් ඊට පස්සේ කුකුල් අම්මා
කෑම උයන්න ගියා.
ඒ අතරේ යාළුවෝ හතර දෙනා
කැලෑවට යන්න කතා වුණා.

ඊට පස්සේ පැටවුන් කැලයට
පිටත් වුණා.

ඔය අතරේ නරිරාල කෑම
සොමින් කැලයේ ඇවිදිනවා.
කැලයේ ඇවිදින පැටවුන්
නරිරාල දැක්කා.

ම්ම්ම්.... අද නම් හොඳ දවසක්
නරිරාල හිතුවා.



නරිරාල පැනපු ගමන් කුකුල්
පැටවු දෙන්නම අල්ල ගත්තා.

බයවුණු තාරා පැටවු දෙන්නා
ගෙදර දිවුවා.





කපටි නරිරාල හරි සතුටින්
ගුහාවට අරගෙන ගියා.
කුකුල් පැටවු මුට්ටියකට දැම්මා.

මුට්ටිය රත් කරන්න දර නැති
නිසා නරිරාලට

කැලයට යන්න වුණා.


කුකුල් පැටවු බය වෙලා හයියෙන්

අඬන්න පටන් ගත්තා.


කෑම සොයන්න කැලයට ආව


කුකුල් තාත්තාට ළමයින්ගේ සද්දට

ඇහුණා.



කුකුල් තාත්තා ළමයි හොයන්න ගත්තා.
කුකුල් තාත්තා දැක්කා ළමයි මුට්ටියකට දාලා
නරිරාලගේ ගෙදර ඉන්නවා.
කුකුල් තාත්තා හෙමින් සැරේ නරිරාලගේ ගෙදරට ආවා.





කුකුල් තාත්තා මුට්ටිය පෙරලලා
කුකුල් පැටවු බේරා ගත්තා.
කුකුල් තාත්තයි කුකුල් පැටවු
දෙන්නයි ඉක්මනට ගෙදර ගියා.

කුකුල් පැටවු අඬමින් කුකුල්
අම්මාගෙන් සමාව ගත්තා.

දර ගේන්න ගිහින් ආපු
නරියාට හොඳටම තරහා
ගිහින් යන්න ගියා.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවක් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශිය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් භික්ෂුන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්

---

# W.M. සෙනුකි ගිහංසා වීරවංශ
# 2 ශ්‍රේණිය E

**ISBN : 978624208359-9**

---

මිල : රු. 80/-